25 සූරත් අල් ෆුර්කාන් (හොඳ නරක වෙන්කරන මිනුම් දණ්ඩය)

ආයත් 1-77 දක්වා.

අල් කුර්ආනය

< සිංහල Sinhala>

සිංහල

මාහිර් රම්ඩීන්

පරිවර්තක

ඉස්ලාම් හවුස් වෙබ් අඩවියේ සංස්කරණ මණ්ඩලය

විචාරය කිරීම

ترجمة معاني القرآن الكريم

سورة الفرقان(25)

من أول الآية حتى 77

< سنهالي >

القرآن الكريم

ترجمة:

ماهر رمدين

مراجعة:

محمد آساد و نخبة من العلماء الكبار

المكتب التعاوني للدعوة وتوعية الجاليات بالربوة
هاتف: ٠٠٩٦٦١١٤٤٥٤٩٠٠+ فاكس: ١٢٦ ٠٩٦٦١١٤٩٧٠+ ص ب: ٢٩٤٦٥ الرياض: ١١٤٥٧
ISLAMIC PROPAGATION OFFICE IN RABWAH
P.O.BOX 29465 RIYADH 11457 TEL: +966 11 4454900 FAX: +966 11 4970126
OFFICERABWAH

(හොඳ නරක වෙන් කරන මිනුම් දණ්ඩය)- ෆුර්කාන් සූරත් අල් 25
77 ආයාත් .මක්කාවෙහි දී පහළ වූවකි
.කි

بِسْمِ اللهِ الرَّحمنِ الرَّحِيْمِ

අපරිමිත දයාන්විත අසමසම කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙනි.

1. අල් කුර්ආනය හා එහි වැදගත්කම.

تَبَارَكَ الَّذِي نَزَّلَ الْفُرْقَانَ عَلَىٰ عَبْدِهِ لِيَكُونَ لِلْعَالَمِينَ نَذِيرًا {1}

ලෝවැසියන්ට එය අවවාදයක් වනු පිණිස තම ගැත්තා මත මිනුම් දණ්ඩය) හෙවත් අල් කුර්ආනය (පහළ කළා වූ ඔහු උත්කෘෂ්ට විය.

2-10. අල්ලාහ්ගේ ඒකීයත්වයට අල්කුර්ආනය ට හා රසූල්වරයා ට ඇනුම්පද කී දේව ආදේශකයින් සඳහා වූ ප්‍රතිචාරය.

الَّذِي لَهُ مُلْكُ السَّمَاوَاتِ وَالْأَرْضِ وَلَمْ يَتَّخِذْ وَلَدًا وَلَمْ يَكُنْ لَهُ شَرِيكٌ فِي الْمُلْكِ وَخَلَقَ كُلَّ شَيْءٍ فَقَدَّرَهُ تَقْدِيرًا {2}

ඔහු වනාහි, අහස්හි හා මහපොළොවෙහි ආධිපත්‍යය ඔහු සතුයතවද ඔහු දරුවකු . තවද එම .නොගත්තේයආධිපත්‍යය තුළ ඔහුට කිසිදු හවුල්කරුවකු නොමැතතවද ඔහු සියලු දෑ . .මැව්වේයතවද එය නිර්ණයකින් නිර්ණය කළේය.

وَاتَّخَذُوا مِنْ دُونِهِ آلِهَةً لَا يَخْلُقُونَ شَيْئًا وَهُمْ يُخْلَقُونَ وَلَا يَمْلِكُونَ لِأَنْفُسِهِمْ ضَرًّا وَلَا نَفْعًا وَلَا يَمْلِكُونَ مَوْتًا وَلَا حَيَاةً وَلَا نُشُورًا {3}

ඔවුහු ඔහුගෙන් තොර ව වෙනත් දෙවිවරුන් ගත්තෝයඔවු .හු පවා මවනු ලැබූවන් ලෙස සිටිය දී ඔවුහු කිසිවක් නොමවතිතවද ඔවුනට යම් . හානියක් හෝ ප්‍රයෝජනයක් හෝ සැලසීමට ඔවුහු බලය නොදරති . තවද ජීවත් කරවීමට හෝ මරණයට පත් කිරීමට හෝනැවත නැගිටුවීමට

හෝ ඔවුහු බලය නොදරති.

وَقَالَ الَّذِينَ كَفَرُوا إِنْ هَٰذَا إِلَّا إِفْكٌ افْتَرَاهُ وَأَعَانَهُ عَلَيْهِ قَوْمٌ آخَرُونَ ۖ فَقَدْ جَاءُوا ظُلْمًا وَزُورًا {4}

මෙය ඔහු ගෙතූ ප්‍රබන්ධයක් මිස නැතමේ සඳහා වෙනත් පිරිසක් . ඔහුට උදව් කළේ යැයි දෙවියන් ප්‍රතික්ෂේප කළවුන් පැවසුවෝය . එහෙයින් සැබැවින්ම ඔවුහු අපරාධයක් හා අවලාදයක් ගෙන ආවෝය.

وَقَالُوا أَسَاطِيرُ الْأَوَّلِينَ اكْتَتَبَهَا فَهِيَ تُمْلَىٰ عَلَيْهِ بُكْرَةً وَأَصِيلًا {5}

ඒවා ඔහු ලියවා ගත් මුතුන් මිත්තන්ගේ ප්‍රබන්ධයන් වෙතිඒවා . ඔහු වෙත උදේ සවස කියවා පෙන්වනුලැබේ යැයි ඔවුහු පවසති.

قُلْ أَنْزَلَهُ الَّذِي يَعْلَمُ السِّرَّ فِي السَّمَاوَاتِ وَالْأَرْضِ ۚ إِنَّهُ كَانَ غَفُورًا رَحِيمًا {6}

අහස්හි හා මහපොළොවේ රහස්‍ය දැ දන්නා, එය පහළ කළේයනියත . වශයෙන්ම ඔහු අති ක්ෂමාශීලී හා මහා කරුණාන්විතයාණන් විය යැයි .නුඹ පවසනු

وَقَالُوا مَالِ هَٰذَا الرَّسُولِ يَأْكُلُ الطَّعَامَ وَيَمْشِي فِي الْأَسْوَاقِ ۙ لَوْلَا أُنْزِلَ إِلَيْهِ مَلَكٌ فَيَكُونَ مَعَهُ نَذِيرًا {7}

මෙම දූතයාණන්ට කුමක් වී දඹුහු ? වෙළඳ .ආහාර අනුභවය කරයි පොළ වල්හි සැරිසරයි .මොහු වෙතට මලක්වරයකු පහළ කරනු ලැබ මොහු සමග (එක්) වී ඔහු අවවාද කරන්නකු ලෙස සිටිය යුතු නොවේ ද? ඔවුහු පවසති.

أَوْ يُلْقَىٰ إِلَيْهِ كَنْزٌ أَوْ تَكُونُ لَهُ جَنَّةٌ يَأْكُلُ مِنْهَا ۚ وَقَالَ الظَّالِمُونَ إِنْ تَتَّبِعُونَ إِلَّا رَجُلًا مَسْحُورًا {8}

එසේ නැතහොත් ඔහු වෙතට නිධානයක් දෙනු ලැබියු යුතු නොවේ ද එසේත් නැතහොත් ඔහුට උයනක් වී එමගින් අනුභව කළ යුතු නොවේ දතවද නුඹලා අනුගමනය ? කරනුයේ හූනියම් කරනු ලැබූ මිනිසෙකු මිස නැතැයි

අපරාධකරුවෝ්පැවසූහ.

ඔවුහු නුඹට උපමා ගෙන හැර පානුයේ කෙසේ දැයි නුඹ ? ඔවුහු .අයීක්ෂණයෙන් බලනු නොමග ගියහ එහෙයින් ඔවුහු .(යහ) මගක් ලබන්නට හැකියාව නොදැරූහ.

انْظُرْ كَيْفَ ضَرَبُوا لَكَ الْأَمْثَالَ فَضَلُّوا فَلَا يَسْتَطِيعُونَ سَبِيلًا {9}

ඔහු (අල්ලාහ්) උත්කෘෂ්ට විය ඔහු . වනාහි ඔහු අභිමත කළේ නම් මීට වඩා ශ්‍රේෂ්ඨ දෑ වශයෙන්, ඒවාට යටින් ගංගා ගලා බස්නා උයන් නුඹට තනා දෙන්නට තිබිණතවද . ඔහු නුඹට මාලිගාවන් තනා දෙනු ඇත.

تَبَارَكَ الَّذِي إِنْ شَاءَ جَعَلَ لَكَ خَيْرًا مِنْ ذَٰلِكَ جَنَّاتٍ تَجْرِي مِنْ تَحْتِهَا الْأَنْهَارُ وَيَجْعَلْ لَكَ قُصُورًا {10}

11-14. නැවත නැගිටුවීම පිළිබඳ ව ප්‍රතික්ෂේප කරන්නන්ගේ ප්‍රතිවිපාක.

නමුත් ඔවුහු අවසන් හෝරාව පිළිබඳ ව බොරු කළෝයතවද අවසන් . හෝරාව බොරු කළවුනට අපි ඇවිළෙන නිරා ගින්න සූදානම් කළෙමු.

بَلْ كَذَّبُوا بِالسَّاعَةِ ۖ وَأَعْتَدْنَا لِمَنْ كَذَّبَ بِالسَّاعَةِ سَعِيرًا {11}

ඈත ස්ථානයක සිට එය ඔවුන්ව දකින විට එහි ඇවිළෙන මහා හඬට ද ගර්ජනයට ද ඔවුහු සවන් දෙති.

إِذَا رَأَتْهُمْ مِنْ مَكَانٍ بَعِيدٍ سَمِعُوا لَهَا تَغَيُّظًا وَزَفِيرًا {12}

තවද ඔවුන් බැඳ දමනු ලැබූවන් ලෙසින් එහි පටු තැනකට හෙළනු ලැබූ විට ඔවුහු එහි විනාශය ,අයැදිති.

وَإِذَا أُلْقُوا مِنْهَا مَكَانًا ضَيِّقًا مُقَرَّنِينَ دَعَوْا هُنَالِكَ ثُبُورًا {13}

අද දින නුඹලා එක් විනාශයක් පමණක් නොඅයැදිනුනුඹලා . විනාශයන් රාශියක්අයැදිනු.

لَا تَدْعُوا الْيَوْمَ ثُبُورًا وَاحِدًا وَادْعُوا ثُبُورًا كَثِيرًا {14}

15,16. දේව බිය බැතිමතුන් සඳහා වූ ප්‍රතිඵල.

قُلْ أَذَٰلِكَ خَيْرٌ أَمْ جَنَّةُ الْخُلْدِ الَّتِي وُعِدَ الْمُتَّقُونَ ۚ كَانَتْ لَهُمْ جَزَاءً وَمَصِيرًا {15}

එය උතුම් දඑසේ නැ ?තහොත් බිය බැතිමතුන්හට ප්‍රතිඥා දෙනු ලැබූ සදාතනික ස්වර්ගය දඑය ඔවුනට ? ප්‍රතිඵලයක් හා ගමනාන්තයක්විය යැයි පවසනු!

لَهُمْ فِيهَا مَا يَشَاءُونَ خَالِدِينَ ۚ كَانَ عَلَىٰ رَبِّكَ وَعْدًا مَسْئُولًا {16}

ඔවුනට එහි අභිමත කරන දෑ ඇත . එය නුඹගේ .සදාතනිකයින්ය පරමාධිපතිවෙත පතනු ලැබූ.ප්‍රතිඥාවක් විය

17-19. දේව ආදේශකයින් අනුගමනය කළවුනට හිමි ප්‍රතිවිපාක.

وَيَوْمَ يَحْشُرُهُمْ وَمَا يَعْبُدُونَ مِنْ دُونِ اللَّهِ فَيَقُولُ أَأَنْتُمْ أَضْلَلْتُمْ عِبَادِي هَٰؤُلَاءِ أَمْ هُمْ ضَلُّوا السَّبِيلَ {17}

තවද එදින ඔවුන් හා අල්ලාහ්ගෙන් තොර ව ඔවුන් නමදිමින් සිටි දෑ ඔහු එක් රැස් කොට මාගේ ගැත්තන් වන මොවුන් නොමග යැව්වේ නුඹලා ද ? එසේනැතහොත් මොවුන් ම ඍජු මාර්ගයෙන් නොමග ගියෝ දැයි ? .විමසනු ඇත

قَالُوا سُبْحَانَكَ مَا كَانَ يَنْبَغِي لَنَا أَنْ نَتَّخِذَ مِنْ دُونِكَ مِنْ أَوْلِيَاءَ وَلَٰكِنْ مَتَّعْتَهُمْ وَآبَاءَهُمْ حَتَّىٰ نَسُوا الذِّكْرَ وَكَانُوا قَوْمًا بُورًا {18}

නුඹ සුපිවිතුරුයනුඹගෙන් තොර . ව භාරකරුවන් ගැනීමට අපට යුතු නොවීයඑනමුත් ඔවුන් මෙනෙහි . කිරීම අමතක කරන තරමට නුඹ ඔවුනට හා ඔවුන්ගේ මුතුන් මිත්තන් හට භුක්ති විඳින්නටසැප පහසුකම් සැළැස්වූවෙහිය තවද ඔවුහු .විනාශ වී යන පිරිසක් වූහ. යැයි ඔවුහු පවසා සිටිනු ඇත.

فَقَدْ كَذَّبُوكُمْ بِمَا تَقُولُونَ فَمَا تَسْتَطِيعُونَ صَرْفًا وَلَا نَصْرًا ۚ

නමුත් නුඹලා පවසන දෑ සම්බන්ධයෙන් සැබැවින්ම ඔවුහුම නුඹලා බොරු කළෝය එහෙයින් . හැරෙන්නට හෝ උදව් (දඬුවමින්)

وَمَنْ يَظْلِمْ مِنْكُمْ نُذِقْهُ عَذَابًا كَبِيرًا {19}

ලබන්නට හෝ නුඹලා ශක්තිය නොදරන්නෙහුය. තවද නුඹලා අතුරින් කවරෙකු අපරාධ කරන්නේ ද අපි ඔහුට මහත් වූ දඬුවමක් භුක්ති විඳින්නට සළස්වමු.

20. දහම් දූතවරු මිනිසුන් වෙති. ඔවුන්ගේ නියම ස්වභාවය

وَمَا أَرْسَلْنَا قَبْلَكَ مِنَ الْمُرْسَلِينَ إِلَّا إِنَّهُمْ لَيَأْكُلُونَ الطَّعَامَ وَيَمْشُونَ فِي الْأَسْوَاقِ ۗ وَجَعَلْنَا بَعْضَكُمْ لِبَعْضٍ فِتْنَةً أَتَصْبِرُونَ ۗ وَكَانَ رَبُّكَ بَصِيرًا {20}

නුඹට පෙර වූ දහම් දූතයින් අතුරින් ඔවුන් ආහාර අනුභව කරන්නන් හා වෙළඳපොළවල්හි ගමන් කරන්නන් ලෙසින් මිස අපි නොඑව්වෙමුතවද . නුඹලාගෙන් ඇතැමෙකු ඇතැමෙකුට පරීක්ෂණයක් බවට පත් නුඹලා ඉවසා දරා ගන්නෙහු .කළෙමු තවද නුඹගේ පරමාධිපති සර්ව ?ද .නිරීක්ෂක විය

21-23. දේව ප්‍රතික්ෂේපකයින්ගේ මුරණ්ඩුකම.

وَقَالَ الَّذِينَ لَا يَرْجُونَ لِقَاءَنَا لَوْلَا أُنْزِلَ عَلَيْنَا الْمَلَائِكَةُ أَوْ نَرَىٰ رَبَّنَا ۗ لَقَدِ اسْتَكْبَرُوا فِي أَنْفُسِهِمْ وَعَتَوْا عُتُوًّا كَبِيرًا {21}

අප වෙත මලක්වරුන් පහළ කරනු ලැබ තිබිය යුතු නොවේ දඑසේ ? නැතහොත් අපගේ පරමාධිපති අපි දැකිය යුතු නොවේ ද) ?යැයි කියමින්(සැබැවින්ම ඔවුනොවුන් තුළම උඩඟු වූහමහත් ලෙස . ඉක්මවා යමින් සීමාව ඉක්මවා .කටයුතු කළෝය

يَوْمَ يَرَوْنَ الْمَلَائِكَةَ لَا بُشْرَىٰ يَوْمَئِذٍ لِلْمُجْرِمِينَ وَيَقُولُونَ حِجْرًا مَحْجُورًا {22}

ඔවුන් මලක්වරුන් දකින දින කිසිදු ශුභාශිංසනයක් අපරාධකරුවන්ට එදින නොමැතතවද වළක්වනු . ලබන බාධකයක් විය යැයි ඔවුහු .පවසති

وَقَدِمْنَا إِلَىٰ مَا عَمِلُوا مِنْ عَمَلٍ

ක්‍රියාවෙන් ඔවුන් සිදු කළ දෑ වෙතට අපි පැමිණියෙමුපසු . ව අපි එය

فَجَعَلْنَاهُ هَبَاءً مَنْثُورًا {23}

විහිදුණු දූවිලි බවට පත් කළෙමු.

24. දෙවියන් විශ්වාස කරන්නන් සතු ප්‍රතිඵල.

أَصْحَابُ الْجَنَّةِ يَوْمَئِذٍ خَيْرٌ مُسْتَقَرًّا وَأَحْسَنُ مَقِيلًا {24}

උයනේ වැසියෝ එදින (ස්වර්ග) වාසස්ථානයෙන්ශ්‍රේෂ්ඨයෝ වෙති . තවද(මධ්‍යහ්න) විවේකී ස්ථානයෙන් ද වඩාත් අලංකාර වෙති.

25-29. මළවුන් නැගිටුවනු ලබන දිනයේ ඇතැම් දර්ශන.

وَيَوْمَ تَشَقَّقُ السَّمَاءُ بِالْغَمَامِ وَنُزِّلَ الْمَلَائِكَةُ تَنْزِيلًا {25}

එදින වලාකුළු මගින් අහස පැළී , මලක්වරුන් පියවරෙන් පියවර පහළ .කරනු ලබති

الْمُلْكُ يَوْمَئِذٍ الْحَقُّ لِلرَّحْمَٰنِ ۚ وَكَانَ يَوْمًا عَلَى الْكَافِرِينَ عَسِيرًا {26}

එදින සැබෑ ආධිපත්‍යය කරුණාන්වි තයාණන් සතුයතවද එය දෙවියන් . ප්‍රතික්ෂේප කරන්නන් හට දුෂ්කර .දිනයක් විය

وَيَوْمَ يَعَضُّ الظَّالِمُ عَلَىٰ يَدَيْهِ يَقُولُ يَا لَيْتَنِي اتَّخَذْتُ مَعَ الرَّسُولِ سَبِيلًا {27}

තවද එදින අපරාධකරු, තම දෑත් සපා කමින් අහෝ ! දූතයාණන් සමග මා මගක් ගන්නට තිබුණා නොවේ දැයි ඔහු පවසයි .

يَا وَيْلَتَىٰ لَيْتَنِي لَمْ أَتَّخِذْ فُلَانًا خَلِيلًا {28}

අහෝ ! මාගේ විනාශය මම අසවල් ! පුද්ගලයා මිතුරෙකු සේ නොගන්නට තිබුණා නොවේ ද?

لَقَدْ أَضَلَّنِي عَنِ الذِّكْرِ بَعْدَ إِذْ جَاءَنِي ۗ وَكَانَ الشَّيْطَانُ لِلْإِنْسَانِ خَذُولًا {29}

මෙනෙහි කිරීම හෙවත් අල්) මා වෙත පැමිණි පසු (කුර්ආනය ව සැබැවින්ම ඔහු මා එයින් නොමග යැවීයතවද ෂෙයිතාන් මිනිසාට දැඩි . .ද්‍රෝහියකු විය

30,31. දේව ප්‍රතික්ෂේපකයින් අල් කුර්ආනය ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ

නබිවරුන්ගේ පැමිණිල්ල, ඔවුන් වෙත පැමිණි නබිවරුන්ට ඔවුන් සතුරුකම් පෑම.

وَقَالَ الرَّسُولُ يَا رَبِّ إِنَّ قَوْمِي اتَّخَذُوا هَٰذَا الْقُرْآنَ مَهْجُورًا {30}

අහෝ ,මාගේ පරමාධිපතියාණනි ! නියත වශයෙන්ම මාගේ ජනයා මෙම කුර්ආනය අත හැර දමනු ලබන්නක් වශයෙන් ගත්තෝ යැයි රසූල්වරයා පැවසීය.

وَكَذَٰلِكَ جَعَلْنَا لِكُلِّ نَبِيٍّ عَدُوًّا مِنَ الْمُجْرِمِينَ ۗ وَكَفَىٰ بِرَبِّكَ هَادِيًا وَنَصِيرًا {31}

එලෙස අපි සෑම නබිවරයෙකුටම අපරාධකරුවන් අතුරින් සතුරෙකු පත් කළෙමුමඟ පෙන්වන් .නෙකු වශයෙන් හා උදව්කරුවෙකු වශයෙන් නුඹගේ පරමාධිපති ප්‍රමාණවත් වේ.

32-34. අල් කුර්ආනය එකවර පහළ නොවූයේ ඇයි?

وَقَالَ الَّذِينَ كَفَرُوا لَوْلَا نُزِّلَ عَلَيْهِ الْقُرْآنُ جُمْلَةً وَاحِدَةً ۚ كَذَٰلِكَ لِنُثَبِّتَ بِهِ فُؤَادَكَ ۖ وَرَتَّلْنَاهُ تَرْتِيلًا {32}

ඔහු වෙත අල් කුර්ආනය එකවර එකම ගොනුවක් සේ පහළ කළ යුතු නොවේ දැ? යි දෙවියන් ප්රතික්ෂේප කළවුන් පැවසූහ .(අහෝ මුහම්මද්!) එලෙසය අපි එමගින් නුඹගේ හදවත් ස්ථාවර කරනු පිණිසය අපි එය කොටසින් කොටස පාරායනය කළෙමු.

وَلَا يَأْتُونَكَ بِمَثَلٍ إِلَّا جِئْنَاكَ بِالْحَقِّ وَأَحْسَنَ تَفْسِيرًا {33}

තවද ඔවුහු නුඹ වෙත උපමාවක් ගෙන නොඑතිසත්‍යය හා වඩාත් . අලංකාර විග්‍රහයක් නුඹ වෙත අපි .ගෙන ආවා මිස

الَّذِينَ يُحْشَرُونَ عَلَىٰ وُجُوهِهِمْ إِلَىٰ جَهَنَّمَ أُولَٰئِكَ شَرٌّ مَكَانًا وَأَضَلُّ سَبِيلًا {34}

තම මුහුණු මතින් (ඇදගෙන ගොස්) නිරය වෙත රැස් කරනු ලබන්නන් වන ඔවුහුමයනවාතැනින් නපුරෝ. තවද මාර්ගයෙන් වඩාත් නොමග වූවෝ.

35-40. නබිවරුන් ප්‍රතික්ෂේප කළ සමූහයන්ගේ විනාශය. ඉන් අප ගත යුතු පාඩම්.

وَلَقَدْ آتَيْنَا مُوسَى الْكِتَابَ وَجَعَلْنَا مَعَهُ أَخَاهُ هَارُونَ وَزِيرًا {35}

අපි මූසාට දේව ග්‍රන්ථය පිරිනැමුවෙමු. තවද අපි ඔහු සමග ඔහුගේ සහෝදර හාරූන් උදව් කරුවකු බවට පත් කළෙමු .

فَقُلْنَا اذْهَبَا إِلَى الْقَوْمِ الَّذِينَ كَذَّبُوا بِآيَاتِنَا فَدَمَّرْنَاهُمْ تَدْمِيرًا {36}

අපගේ සංඥාවන් බොරු කළවුන් වෙත නුඹලා යනු යැයි පැවසුවෙමු . තවද අපි ඔවුන් සහමුලින්ම විනාශ .කළෙමු

وَقَوْمَ نُوحٍ لَمَّا كَذَّبُوا الرُّسُلَ أَغْرَقْنَاهُمْ وَجَعَلْنَاهُمْ لِلنَّاسِ آيَةً ۖ وَأَعْتَدْنَا لِلظَّالِمِينَ عَذَابًا أَلِيمًا {37}

තවද නූහ්ගේ ජනයා ද ඔවුහු එම , දහම් දූතවරුන් බොරු කළ කල්හි අපි ඔවුන් දියේ ගිල්වීමුතවද අපි . ඔවුන් ජනයාට සංඥාවක් බවට පත් තවද අපි අ .කළෙමුපරාධකරුවන්ට වේදනීය දඬුවමක් පිළියෙල කළෙමු .

وَعَادًا وَثَمُودَ وَأَصْحَابَ الرَّسِّ وَقُرُونًا بَيْنَ ذَٰلِكَ كَثِيرًا {38}

තවද ආද් ජනයා සමූද් ජනයා රස් වාසීන් හා ඒ අතර වූ බොහෝමයක් පරම්පරාවන් ද (.අපි විනාශ කළෙමු)

وَكُلًّا ضَرَبْنَا لَهُ الْأَمْثَالَ ۖ وَكُلًّا تَبَّرْنَا تَتْبِيرًا {39}

තවද සියල්ලන් ගැන අපි ඔවුන්ට උපමා ගෙන හැර පෑවෙමුතවද ඒ . සියල්ලන් අපි දරුණු ලෙස විනාශ .කර දැමුවෙමු

وَلَقَدْ أَتَوْا عَلَى الْقَرْيَةِ الَّتِي أُمْطِرَتْ مَطَرَ السَّوْءِ ۚ أَفَلَمْ يَكُونُوا يَرَوْنَهَا ۚ بَلْ كَانُوا لَا يَرْجُونَ نُشُورًا {40}

තවද ශාපකාරී වැසි වස්සනු ලැබූ ගම්මානය ඔස්සේ සැබැවින්ම ඔවුහු පැමිණියහළුවිට ඔවුහු එය . (මරණින් පසු) නමුත් ?නොදුටුවෝ ද නැවත නැගිටුවනු ලැබීම ගැන ඔවුහු අපේක්ෂා නොකරන්නන් ලෙස

.සිටියහ

41-44. දෙවියන් කෙරෙහි ආදේශ තබන්නන්හට උපමාවක්

وَإِذَا رَأَوْكَ إِنْ يَتَّخِذُونَكَ إِلَّا هُزُوًا أَهَٰذَا الَّذِي بَعَثَ اللَّهُ رَسُولًا {41}

තවද ඔවුන් නුඹ ව දුටු විට දූතයකු ' වශයෙන් අල්ලාහ් එවා සිටියේ ?මොහුව දැ'යිසරදමක් (පවසමින්) ලෙසින් මිස ඔවුහු නුඹ ව නොගනිති .

إِنْ كَادَ لَيُضِلُّنَا عَنْ آلِهَتِنَا لَوْلَا أَنْ صَبَرْنَا عَلَيْهَا ۚ وَسَوْفَ يَعْلَمُونَ حِينَ يَرَوْنَ الْعَذَابَ مَنْ أَضَلُّ سَبِيلًا {42}

අප අපගේ දෙවිවරුන් මත (ස්ථිර ලෙස) රැඳී නොසිටියා නම් ඔහු ඔවුන්ගෙන් අප නොමඟ යවන්නට තිබුණිඑම (.යැයි ඔවුහු පවසති) . දඬුවම ඔවුන් දකින විට මාර්ගයෙන් වඩාත් නොමග ගියවුන් කවුරුන්දැයි ඔවුහු මතු දැන ගනු ඇත.

أَرَأَيْتَ مَنِ اتَّخَذَ إِلَٰهَهُ هَوَاهُ أَفَأَنْتَ تَكُونُ عَلَيْهِ وَكِيلًا {43}

තම ආශාවන් තම දෙවියන් ලෙස ගත් අය නුඹ නුදුටුවෙහි ද ?එවිට නුඹ ඔහු වෙත භාරකරුවකු වන්නෙහි ද?

أَمْ تَحْسَبُ أَنَّ أَكْثَرَهُمْ يَسْمَعُونَ أَوْ يَعْقِلُونَ ۚ إِنْ هُمْ إِلَّا كَالْأَنْعَامِ ۖ بَلْ هُمْ أَضَلُّ سَبِيلًا {44}

නියත වශයෙන්ම ඔවුන්ගෙන් බහුතරයක් දෙනා සවන් දෙනු ඇතැයි හෝ වටහා ගනු ඇතැයි නුඹ සිතන්නෙහි දඔවුන් ගොවිප ?ළ සතුන් මෙන් මිස නැත ,එසේ නොව . මාර්ගයෙන් වඩාත් නොමග ගියවුන් මොවුහුය .

45-62. අල්ලාහ්ගේ ආශිර්වාද හා ඔහුගේ ශක්තිය විදහාපාන ඇතැම් විද්‍යාමානයන්.

أَلَمْ تَرَ إِلَىٰ رَبِّكَ كَيْفَ مَدَّ الظِّلَّ وَلَوْ شَاءَ لَجَعَلَهُ سَاكِنًا ثُمَّ جَعَلْنَا الشَّمْسَ عَلَيْهِ دَلِيلًا {45}

නුඹගේ පරමාධිපති දෙස ඔහු හෙවණැල්ල කෙසේ දිගු හැරියේ දැයි නුඹ නොබැලුවෙහි දතවද ඔහු ? අභිමත කළේ නම් එය එක්තැන් වූවක් බවට ඔහු පත් කරන්නට

පසු .තිබුණි ව අපි ඒ වෙත සාධකයක් බවට හිරු පත් කළෙමු .

ثُمَّ قَبَضْنَاهُ إِلَيْنَا قَبْضًا يَسِيرًا {46}

පසු ව අපි එය සීරුවෙන් අප වෙත හසුකරගනිමින් අත්පත් කර ගන්නෙමු.

وَهُوَ الَّذِي جَعَلَ لَكُمُ اللَّيْلَ لِبَاسًا وَالنَّوْمَ سُبَاتًا وَجَعَلَ النَّهَارَ نُشُورًا {47}

රාත්‍රිය වස්ත්‍රයක් බවටත් නින්ද විවේකයක් බවටත් නුඹලාට ඇති කළේ ඔහුයතවද දහවල . ජීවනෝපාය සඳහා ඇති කළේද .ඔහුය

وَهُوَ الَّذِي أَرْسَلَ الرِّيَاحَ بُشْرًا بَيْنَ يَدَيْ رَحْمَتِهِ ۚ وَأَنْزَلْنَا مِنَ السَّمَاءِ مَاءً طَهُورًا {48}

ඔහුගේ ආශිර්වාදය අතුරින් සුළඟ ශුභාසිරි වශයෙන් එව්වේ ඔහුයතවද . අපි අහසින් පිරිසිදු ජලය පහළ .කළෙමු

لِنُحْيِيَ بِهِ بَلْدَةً مَيْتًا وَنُسْقِيَهُ مِمَّا خَلَقْنَا أَنْعَامًا وَأَنَاسِيَّ كَثِيرًا {49}

එමගින් අප මළ භූමියක් ජීවමාන කරනු පිණිසත්අප මැවූ දෑ අතුරින් . ගොවිපළ සතුන් හා බොහෝමයක් මිනිසුනට අප ජලය සපයනු පිණිසත්ය .

وَلَقَدْ صَرَّفْنَاهُ بَيْنَهُمْ لِيَذَّكَّرُوا فَأَبَىٰ أَكْثَرُ النَّاسِ إِلَّا كُفُورًا {50}

ඔවුන් මෙනෙහි කරනු පිණිස ඔවුන් අතරට එය අපි හරවා (හරව) නමුත් ජනයා අතුරින් .එව්වෙමු බොහෝමයක් දෙනා ගුණමකුභාවයෙන් මිස එය .පිළිගත්තේ නැත

وَلَوْ شِئْنَا لَبَعَثْنَا فِي كُلِّ قَرْيَةٍ نَذِيرًا {51}

අපි අභිමත කළේ නම් සෑම ගම්මානයකටම අවවාද කරන්නෙකු එවන්නට තිබුණි.

فَلَا تُطِعِ الْكَافِرِينَ وَجَاهِدْهُمْ بِهِ

එහෙයින් දේව ප්‍රතික්ෂේපකයින්ට නුඹ අවනත නොවනුතවද නුඹ .

جِهَادًا كَبِيرًا {52}

ඔවුන් සමග එමගින් දැඩි පරිශ්‍රමය කින් යුතු ව වෙහෙසෙනු.

وَهُوَ الَّذِي مَرَجَ الْبَحْرَيْنِ هَٰذَا عَذْبٌ فُرَاتٌ وَهَٰذَا مِلْحٌ أُجَاجٌ وَجَعَلَ بَيْنَهُمَا بَرْزَخًا وَحِجْرًا مَحْجُورًا {53}

මෙය ඉමිහිරි මිරිදියයිඑය ලුණු . රසැති කරදියයි යනුවෙන් මුහුදු දෙක අතරවෙන් කළේ ඔහුයතවද . ඒ දෙක අතර බාධකයක් හා තහනම් කරනු ලැබූ තහනම් සීමාවක් ඔහු .ඇති කළේය

وَهُوَ الَّذِي خَلَقَ مِنَ الْمَاءِ بَشَرًا فَجَعَلَهُ نَسَبًا وَصِهْرًا ۗ وَكَانَ رَبُّكَ قَدِيرًا {54}

ජලයෙන් මිනිසා මැව්වේ ඔහුයපසු . ව ඔහු ඔහුට පරම්පරානුගත නෑකම් ද විවාහ නෑකම් ද ඇති කළේයතවද . නුඹගේ පරමාධිපති සර්ව ශක්තිය ඇත්තායග

وَيَعْبُدُونَ مِنْ دُونِ اللَّهِ مَا لَا يَنْفَعُهُمْ وَلَا يَضُرُّهُمْ ۗ وَكَانَ الْكَافِرُ عَلَىٰ رَبِّهِ ظَهِيرًا {55}

තවද ඔවුහු අල්ලාහ්ගෙන් තොර වූ තමන්හට ප්‍රයෝජනයක් ලබා දිය නොහැකි එමෙන්ම තමන්හට හානියක් සිදු කළ නොහැකි දෑට ගැතිකම් කරතිතවද දෙවියන් . ප්‍රතික්ෂේප කරන්නාඔහුගේ පරමාධිපතිට එරෙහි ව උර දෙන්නකු විය.

وَمَا أَرْسَلْنَاكَ إِلَّا مُبَشِّرًا وَنَذِيرًا {56}

ශුභාරංචි දන්වන්නෙකු හා අවවාද කරන්නෙකු ලෙසින් මිස අපි නුඹ ව නොඑව්වෙමු.

قُلْ مَا أَسْأَلُكُمْ عَلَيْهِ مِنْ أَجْرٍ إِلَّا مَنْ شَاءَ أَنْ يَتَّخِذَ إِلَىٰ رَبِّهِ سَبِيلًا {57}

කවරෙකු අභිමත කරන්නේ ද ඔහු තම පරමාධිපති වෙත වූ මගක් සොයා ගන්නට මිස (වෙනත්) කිසිදු කුලියක් මම ඒ සඳහා නුඹලාගෙන් නොඉල්ලමි යැයි නුඹ පවසනු .

وَتَوَكَّلْ عَلَى الْحَيِّ الَّذِي لَا يَمُوتُ

තවද අමරණීය වූ සදා ජීවමානයාණන් වෙත නුඹ භාර

وَسَبِّحْ بِحَمْدِهِ ۚ وَكَفَىٰ بِهِ بِذُنُوبِ عِبَادِهِ خَبِيرًا {58}

කරනුතවද ඔහුගේ ප්‍රශංසාව තුළින් .
තම ගැත්තතන්ගේ .සුවිශුද්ධ කරනු
පාපකම් පිළිබඳ තොරතුරු දන්නා
.වශයෙන් ඔහු ප්‍රමාණවත්ය

الَّذِي خَلَقَ السَّمَاوَاتِ وَالْأَرْضَ وَمَا بَيْنَهُمَا فِي سِتَّةِ أَيَّامٍ ثُمَّ اسْتَوَىٰ عَلَى الْعَرْشِ ۚ الرَّحْمَٰنُ فَاسْأَلْ بِهِ خَبِيرًا {59}

ඔහු වනාහි අහස් හා මහපොළොව ද
ඒ දෙක අතර ඇති දෑ ද දින හයකින්
මැව්වේයපසු . ව මහාකරුණාන්විත
යාණන් අර්ෂ් මත වියළුහෙයින් ඒ .
පිළිබඳ ව අභිඥානවන්තයා(වන ඔහු)
ගෙන්ම විමසනු .

وَإِذَا قِيلَ لَهُمُ اسْجُدُوا لِلرَّحْمَٰنِ قَالُوا وَمَا الرَّحْمَٰنُ أَنَسْجُدُ لِمَا تَأْمُرُنَا وَزَادَهُمْ نُفُورًا ۩ {60}

තවද මහාකරුණාන්විතයාණන්ට
සුජුද් කරනුයි ඔවුනට කියනු ලැබූ
විට මහා කරුණාන්විතයාණන්
කවුරුන් දනුඹ අපට අණ කරන ?
දැට අපි සුජුද් කළ යුතු දැයිඔවුහු
පවසා සිටියහ. තවද එය ඔවුනට
(දේව විශ්වාසයෙන්) පලා යෑම
අධික කළේය.

تَبَارَكَ الَّذِي جَعَلَ فِي السَّمَاءِ بُرُوجًا وَجَعَلَ فِيهَا سِرَاجًا وَقَمَرًا مُنِيرًا {61}

අහසෙහි තාරකා මණ්ඩල ඇති කළ
ඔහු උත්කෘෂ්ට විය තවද පහන .
ද ආලෝකය (හෙවත් සූර්යයා)
.විහිදුවන සඳු ද ඔහු එහි ඇති කළේය

وَهُوَ الَّذِي جَعَلَ اللَّيْلَ وَالنَّهَارَ خِلْفَةً لِمَنْ أَرَادَ أَنْ يَذَّكَّرَ أَوْ أَرَادَ شُكُورًا {62}

තවද උපදෙස් ලබන්නට අපේක්ෂා
කරන්නන්ට හෝ කෘතවේදීත්වය
අපේක්ෂා කරන්නන්ට හෝ රාත්‍රිය
හා දහවල විවිධත්වයෙන් යුතුව ඇති
කළේ ඔහුය.

63-77. අල්ලාහ්ගේ ගැත්තන්ගේ ගතිගුණ කෙසේද?

وَعِبَادُ الرَّحْمَٰنِ الَّذِينَ يَمْشُونَ عَلَى

මහාකරුණාන්විතයාණන්ගේ
ගැත්තන් වනාහි ඔවුහු මහපොළොව

الْأَرْضِ هَوْنًا وَإِذَا خَاطَبَهُمُ الْجَاهِلُونَ قَالُوا سَلَامًا {63}	මත නිහතමානී ව ගමන් කරති . අඥානයෝ ඔවුන් සමග කතා කළ .යැයි පවසති !විට සාමය වේවා
وَالَّذِينَ يَبِيتُونَ لِرَبِّهِمْ سُجَّدًا وَقِيَامًا {64}	තවද ඔවුහු වනාහි තම පරමාධිපතිට සුජූද් කරමින් ද නැගිට සිටිමින් ද රාත්‍රිය ගත කරන්නො වෙති.
وَالَّذِينَ يَقُولُونَ رَبَّنَا اصْرِفْ عَنَّا عَذَابَ جَهَنَّمَ ۖ إِنَّ عَذَابَهَا كَانَ غَرَامًا {65}	තවද අපෙග් පරමාධිපතියාණනි , නිරයේ දඬුවම අපගෙන් ඉවත් කරනු නියත වශයෙන්ම එහි දඬුවම !මැනව .අනිවාර්යය වන්නක් විය
إِنَّهَا سَاءَتْ مُسْتَقَرًّا وَمُقَامًا {66}	නියත වශයෙන්ම එය වාසස්ථානයෙන් හා නවාතැනින් නපුරු විය .
وَالَّذِينَ إِذَا أَنْفَقُوا لَمْ يُسْرِفُوا وَلَمْ يَقْتُرُوا وَكَانَ بَيْنَ ذَٰلِكَ قَوَامًا {67}	තවද ඔවුහු වනාහිඔවුන් වියදම් , කරන විට නාස්ති නොකරතිතවද . මසුරු ද නොවෙතිඒ අතර මැද . මාවතක එය විය.
وَالَّذِينَ لَا يَدْعُونَ مَعَ اللَّهِ إِلَٰهًا آخَرَ وَلَا يَقْتُلُونَ النَّفْسَ الَّتِي حَرَّمَ اللَّهُ إِلَّا بِالْحَقِّ وَلَا يَزْنُونَ ۚ وَمَنْ يَفْعَلْ ذَٰلِكَ يَلْقَ أَثَامًا{68}	තවද ඔවුහු වනාහි අල්ලාහ් සමග තවත් දෙවියකුට කන්නලව් නොකරතිවිනාශ) තවද අල්ලාහ් . තහනම් කළ ආත්මය (කිරීමට යුක්තියෙන් තොර ව මිස ඔවුහු ඝාතනය නොකරතිතවද කාම . තවද .අපචාරයේ නිරත නොවෙති කවරෙකු එය සිදු කරන්නේ ද ඔහු ප්‍රතිවිපාකය ලබනු ඇත.
يُضَاعَفْ لَهُ الْعَذَابُ يَوْمَ الْقِيَامَةِ وَيَخْلُدْ فِيهِ مُهَانًا {69}	මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ එම දඬුවම ඔහුට ගුණ කරනු ලැබේඔහු එහි නින්දාවට පත් . ව

සදාකල් වෙසෙනු ඇත .

إِلَّا مَنْ تَابَ وَآمَنَ وَعَمِلَ عَمَلًا صَالِحًا فَأُولَٰئِكَ يُبَدِّلُ اللَّهُ سَيِّئَاتِهِمْ حَسَنَاتٍ ۗ وَكَانَ اللَّهُ غَفُورًا رَحِيمًا {70}	නමුත් පශ්චාත්තාප වී විශ්වාස කොට යහකම් සිදු කළ අය හැරතම . පාපකම් යහකම් බවට අල්ලාහ් .පරිවර්තනය කරන උදවිය ඔවුහුමය තවද අල්ලාහ් අතික්ෂමාශීලී මහාකරුණාන්විතයාණන් විය .
وَمَنْ تَابَ وَعَمِلَ صَالِحًا فَإِنَّهُ يَتُوبُ إِلَى اللَّهِ مَتَابًا {71}	තවද කවරෙකු පශ්චාත්තාප වී යහකම් සිදු කළේ ද එවිට නියත වශයෙන්ම ඔහු පාප ක්ෂමාව පිළිගත හැකි අයුරින් අල්ලාහ් වෙත පශ්චාත්තාප වී යොමුවන්නෙකු වනු ඇත.
وَالَّذِينَ لَا يَشْهَدُونَ الزُّورَ وَإِذَا مَرُّوا بِاللَّغْوِ مَرُّوا كِرَامًا {72}	තවද ඔවුහු වනාහි බොරුව ට සාක්ෂි නොදරතිතවද ඵලක් නැති දෑ . අසලින් ඔවුන් ගමන් ගත් විට ගෞරවාන්විත අයුරින් ඔවුහු ගමන් ගනිති .
وَالَّذِينَ إِذَا ذُكِّرُوا بِآيَاتِ رَبِّهِمْ لَمْ يَخِرُّوا عَلَيْهَا صُمًّا وَعُمْيَانًا {73}	තවද ඔවුහු වනාහි ඔවුන්ගේ පරමාධිපතිගේ වදන් මෙනෙහි කරනු ලබන විට බිහිරි බවින් හෝ අන්ධ බවින් හෝ ඒ මත නොවැටෙති.
وَالَّذِينَ يَقُولُونَ رَبَّنَا هَبْ لَنَا مِنْ أَزْوَاجِنَا وَذُرِّيَّاتِنَا قُرَّةَ أَعْيُنٍ وَاجْعَلْنَا لِلْمُتَّقِينَ إِمَامًا {74}	තවද ඔවුහු වනාහි අපගේ ' අපගේ ,පරමාධිපතියාණනි බිරියන්ගෙන් ද අපගේ දරු පරපුරෙන් ද නෙත් පිනවන සිසිල අපට ඇති කරනු මැනව ! තවද බිය බැතිමතුන් මෙහෙයවන්නන් බවට අප පත් කරනු මැනව යැයි ! .පවසන්නන් වෙති

أُولَٰئِكَ يُجْزَوْنَ الْغُرْفَةَ بِمَا صَبَرُوا وَيُلَقَّوْنَ فِيهَا تَحِيَّةً وَسَلَامًا {75}

ඔවුන් ඉවසා සිටි බැවින් (ස්වර්ග) .කුටි පිරිනමනු ලබන්නෝ ඔවුහුමය තවද ඔවුහු එහි සුබ පැතුම් හා සලාම් සමග පිළිගනු ලබති.

خَالِدِينَ فِيهَا ۚ حَسُنَتْ مُسْتَقَرًّا وَمُقَامًا {76}

ඔවුහු එහි සදාතනිකයින් වෙති . වාසස්ථානයෙන් හා නවාතැනින් එය .යහපත් විය

قُلْ مَا يَعْبَأُ بِكُمْ رَبِّي لَوْلَا دُعَاؤُكُمْ ۖ فَقَدْ كَذَّبْتُمْ فَسَوْفَ يَكُونُ لِزَامًا {77}

නුඹලාගේ කන්නලව් නොවී නම් මාගේ පරමාධිපති නුඹලා ව නොසලකා හරිනු ඇතනමුත් . නුඹලා බොරු කළෙහුය එහෙයින් . නියමය මතු සිදු (දඬුවමේ) වනු ඇත.

IslamHouse.com